## විදේශ වෙළඳාම ශ්‍රී ලංකාවේ දේශපාලන පසුබිමට බලපෑම් කළ අන්දම

ජේ.එම්. සුධර්මාවතී J.M. Sudharmawathie [1]

විදේශ වෙළඳාම හා මෙරට ආර්ථික තත්ත්වය, විදේශ ආක්‍රමණ නිසා මෙරට දේශපාලන පසුබිමෙහි ඇතිවූ ගැටලු සහිත පසුබිම යන තේමා පිළිබඳ බොහෝ අධ්‍යයන සිදුකර ඇත. එහෙත් මෙවැනි පර්යේෂණයක් පිළිබඳ අවධානය යොමුකර නොමැත. එහෙයින් මෙම පර්යේෂණය කෙරෙහි මෙහිදී අවධානය යොමුකර ඇත. මෙම පර්යේෂණයේදී ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය ඉවහල් කරගනිමින් තොරතුරු එක්රැස් කරගන්නා ලදී.

ශ්‍රී ලංකාව පිහිටීම අතින් ලොව අන් රටවලට වඩා සුවිශේෂී ස්ථානයක් හිමිකරගෙන ඇත. ඉන්දියානු සාගරයේ වෙළඳ මාර්ග ආසන්නයේ කේන්ද්‍රීය ස්ථානයක පිහිටා තිබීමත්, ස්වභාවික වරායන් කිහිපයක් තිබීමත් දිවයිනක් වීමත් නිසා අතීතයේ සිට ම ලංකාව පෙර අපර දෙදිග රටවල භාණ්ඩ හුවමාරු කරගන්නා වූ මහා වෙළඳ මධ්‍යස්ථානයක් විය. මේ නිසා ලොව විවිධ රටවලින් වෙළෙන්දෝ මෙරටට පැමිණියහ. මෙලෙස පැමිණි වෙළඳුන් මෙරට දේශපාලන පසුබිම කෙරෙහි බලපෑම් කිරීමට සමත් වූ අවස්ථා කිහිපයක් ලංකා ඉතිහාසයේ සඳහන් වේ. ඒ දකුණු ඉන්දියානු චෝළයින් හා චීනය යි. චෝළයන් මෙරට ආක්‍රමණය කිරීමේ අරමුණින්ම කඩාවැදුණු අවස්ථා රැසකි. ඒවා ආක්‍රමණ ලෙසට සිදු කිරීම නිසා මෙරට පාලකයන් ඒවාට මුහුණදීමට ආරක්ෂක විධිවිධාන සකස්කරගෙන තබාගැනීමටද පියවර ගෙන තිබිණි.

චීන ලංකා සම්බන්ධතා පහළොස්වන සියවස දක්වා කිසිදු විටෙක මෙරට දේශපාලනයට මැදිහත් නොවීය. එහෙත් පහළොස්වන සියවසේ මුල් භාගයේදී සිදුකළ මැදිහත්වීම මෙරට ඉතිහාසයේ ගැටලු සහිත පසුබිමක් ඇතිකර තිබේ.

මෙම තත්ත්වයන් කෙරෙහි අවධානය යොමු කිරීමේදී එතුළින් ඇති කළ බලපෑම් මෙරට දේශපාලන ප්‍රවාහයේ ගලා යාමට ප්‍රබල බාධකයක් වී ඇත. එපමණක් නොව, වෙළඳාම ගැටුම් හා යුද්ධ ඇති කිරීමට මුල් වී තිබේ. එමෙන් ම ඔවුහු මෙරට දේශපාලන පසුතලයේ බලවතුන් වීමෙන් මෙරට ආදායම් ඉපැයීමේ මාර්ග, ආදායම සෘජු ව හා වක්‍ර ලෙස හිමි කරගැනීමට සමත් වූහ.

ප්‍රමුඛ පද - විදේශ වෙළඳාම, ශ්‍රී ලංකාව, දකුණු ඉන්දියාව, චීනය, යුද්ධ, ආර්ථික තත්ත්වය

[1] . ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයන අංශය, සමාජීයවිද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. sudharma@kln.ac.lk